VERITÉ
විදසුන්

Originally Published in: [Mawbima, January, 2015]

## විශ්වාසනීයත්වයෙන් යුතු අයවැයක් සඳහා පාර්ලිමේන්තුවේ විචාරාත්මක මැදිහත්වීම ශක්තිමත් කිරීම

ශ්‍රී ලංකාවේ පසුගිය අයවැය සළකා බැලීමේදී පෙනී යන්නේ, ප්‍රසිද්ධ කරන ලද අයවැය ප්‍රතිපාදන වෙන් කිරීම් සහ සැබෑ වියදම් අතර සැළකිය යුතු වෙනසක් පවතින බවයි. මෙම පරතරය මගින්, විශ්වාසනීයත්වය පිළිබඳ ප්‍රශ්නයක් ඇතිකළ හැකිය. උදාහරණ ලෙස, අපගේ පෙර විශ්ලේෂණය වන 'අයවැය වෙනුවෙන් වන්දි ගෙවන්නේ කවුද?' සහ 'කෘෂි' සහ 'ආරක්ෂක' අයවැය මගින් අප්‍රකාශිත අයවැය ප්‍රමුඛතා හෙළිවෙයි' යන ඒවා දැක්විය හැකිය.

කෘෂි සහ වාරි කර්මාන්ත සඳහා වෙන්කර ඇති ප්‍රතිපාදන මෙහිදී වැදගත් වෙයි. රජයේ සංඛ්‍යා ලේඛන අනුව, මෙම පුළුල් පරාසය තුළ පැතිරුණු ප්‍රතිපාදන වෙන් කිරීම් සහ වියදම් අතර පවතින පරතරය වසරින් වසර වර්ධනය විය. 2010, 2011, 2012 සහ 2013 යන වර්ෂ වලදී ප්‍රතිපාදන වලට වඩා වියදම් අඩු වූ අතර, එය පිලිවෙලින් 9%, 23%, 34% සහ 67% විය. 9% ක් වූ වෙනස් වීම ඉහළ අගයක් වුවත් එය නොසළකා හැරිය යුතු තරමේ එකක් ලෙස හැදින්විය හැකිය. නමුත්, 34% සහ 67% වැනි ඉහල යෑම් විශ්වාසනීයත්වය පිළිබඳ බරපතල ගැටළු මතු කරයි.

මෙම කාලය තුළ කෘෂි සහ වාරි කර්මාන්ත යටතේ වූ සැබෑ වියදම බිලියන 67 සහ 77 අතර උච්චාවචනය විය. මෙම ප්‍රවර්ග සඳහා වූ ප්‍රතිපාදන වැඩි කරන බවට පාර්ලිමේන්තුව විසින් සහතික වුවත්, විධායකය සහ **නිලධාරීවාදය** එසේ කිරීමට අසමත් වීම තුළ මෙම නොගැලපුම නිර්මාණය විය. මෙම නොගැලපුම නිවරදි කිරීමේ බලයක් පාර්ලිමේන්තුවට තිබුනේ නැත. මෙම **හිදැස් සෑමවිටම සොයාගනු ලැබුනේ** එය සිදු වූවායින් පසුව වන අතර, තීරණ ගැනීම සහ එම වර්ෂය තුළ දී සැබවින්ම ඒවා ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය අතර වෙනස වසර ගණනවාක් තිස්සේ නිසි **පාලනයකට** ළක් වුයේ නැත.

<u>සංවර්ධන ක්‍රියාකාරකම් - ඔර්විලියානු **සුලාපය**</u>

අයවැය ක්‍රියාවලිය සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ බෙලහීනතාව සහ විශ්වාසනියත්වය පිළිබඳ ගැටලුවට ආමන්ත්‍රණය කරන්නාවූ විශේෂ කොටසක් ශ්‍රී ලංකා නීතියේ අඩංගුය. නමුත්, මෙම නිතිය අයුතු ලෙස භාවිතවන ආකාරය, කාලින තත්වය මගින් පෙන්නුම් කරයි.

2014 මුල්‍ය වර්ෂය සඳහා ගණන් බලන ලද සමස්ත වියදම ට්රිලියන 2.1 කි. මෙය වැය ශිර්ෂ 208 ක් යටතේ වියදම් කරන ලදි. මෙහෙයුම් ක්‍රියාකාරකම් සහ සංවර්ධන ක්‍රියාකාරකම් ලෙස මෙම වියදම් කොටස් දෙකකට වෙන්ක හැකිය. වැය ශීර්ෂ වලින් 99 ක් විශේෂිත වශයෙන්ම සංවර්ධන ක්‍රියාකාරකම් යටතේ වූ ඒවාය.

'ජාතික අයවැය දෙපාර්තමේන්තුව' (මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යංශය යටතේ වූ දෙපාර්තමේන්තුවකි) යන වැය ශීර්ෂය යටතේ සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා වූ ප්‍රතිපාදන විශේෂිත වෙයි. ජාතික අයවැය දෙපාර්තමේන්තුව යටතේ වූ ප්‍රතිපාදන , වෙනත් ඕනෑම අමාත්‍යංශයක වියදම් පියවීම සඳහා යොදාගත හැකිය. ජාතික අයවැය දෙපාර්තමේන්තුව සඳහා වූ ප්‍රතිපාදන වෙනත් අමාත්‍යාංශයක් සඳහා යොදාගැනීම

සඳහා පාර්ලිමේන්තු අවසරය අවශ්‍ය නොවන අතර, භාණ්ඩාගාර ඇති බල අධිකාරිත්වය මගින් බලපෑම් කුළ හැකිය. පවතින්නාවූ එකම සුරක්ෂිතතාව ඉතාම දුර්වල එකකි: ප්‍රතිපාදන වෙනත් අමාත්‍යාංශයකට මාරු කිරීමෙන් මාස දෙකක් තුළ පාර්ලිමේන්තුවට දැනුම් දිය යුතුය.

2013 වර්ෂයේ අංක 36 දරන විසර්ජන පනතේ 6 (1) කොටස මගින් මෙම ක්‍රියාවලිය පාලනය කරනු ලැබේ.

'පළමුවන උප ලේඛනයේ , 'ජාතික අයවැය දෙපාර්තමේන්තුව' යන ශීර්ෂය යටතේ 'සංවර්ධන කටයුතු' වැඩසටහන යටතේ, පුනරාවර්තන වියදම් හෝ ප්‍රාග්ධන වියදම් සඳහා වෙන්කර ඇති මුදල්, පාර්ලිමේන්තුව විසින් අදාළ මුදල් වර්ෂය වෙනුවෙන් අනුමත කරන ලද මුද්‍රිත අයවැය ඇස්තමේන්තුවේ දක්වා ඇති මාර්ගෝපදේශවලට යටත්ව, භාණ්ඩාගාරයේ ලේඛම්වරයාගේ නියමය අනුව හෝ තත්කාර්ය සඳහා භාණ්ඩාගාරයේ ලේඛම්වරයා විසින් බලය දෙනු ලැබිය හැකි භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේඛම්වරයෙකුගේ නියමය නැතහොත් ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජෙනරාල්වරයාගේ නියමය අනුව, ඒ උප ලේඛනයේ වෙනත් යම් ශීර්ෂයක් යටතේ වූ වෙනත් යම් වැඩසටහනකට මාරු කරනු ලැබිය හැකිය. එසේ මාරු කරන ලද මුදල්, අදාළ අමාත්‍යාංශය වෙත කරන ලද පරිපූරක වෙන්කිරීමක් ලෙස සලකනු ලැබිය යුතු අතර..'

2014 වර්ෂයේ ජනවාරි මාසයේ සිට එම වර්ෂයේ දෙසැම්බර් මාසය දක්වා වූ මූල්‍ය වර්ෂය සඳහා 2013 වර්ෂයේ සම්මත කරන ලද අයවැය වාර්තාව මගින් බිලියන 62ක මුදලක් ජාතික අයවැය සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා බැර කරන ලදී. මෙම මුදල, කෘෂි සහ වාරි කර්මාන්ත සඳහා රජය වියදම් කරන ලද මුළු මුදලට ඉතාම ආසන්න අගයකි. වාර්ෂික 'දැයට කිරුළ' වැඩසටහන සඳහා බිලියන 9 ක මුදල යොදා ගනු ලැබුවේ, මෙම 'අභිමතානුසාරී හිඩැස්'තුළිනි. බිලියන 9ක් වූ මෙම මුදල එතරම් විශාල ලෙෂ නොපෙනුවත්, රජය විසින් දිළිඳු ජනතාවගේ සුභ සාධනය සඳහා 'සමෘද්ධි වැඩසටහන' යටතේ වාර්ෂිකව වියදම් කරනු ලබන මුදලද බිලියන 9 කට ආසන්න බව සලකා බැලූ විට, යම් තැති ගැනීමක් ඇති වෙයි.

2015 වර්ෂයේදී රජය බිලියන 90ක මුදලක් මෙම ජාතික අයවැය ප්‍රතිපාදන යටතට ගෙන එන ලදී (46% වර්ධනයක් පෙන්වනු ලබන එකම වැය ශීර්ෂය මෙයයි). මෙයට සිදුවීම අයවැය සකස් කිරීමෙහි පවතින මෙම දුර්වලතාව සහ විශ්වාසනීයත්වය පිළිබඳ ගැටලුව මතුකර දැක්වයි.


**<u>යන්තම් බුරුල දීම සහ අවසානයේ කරට නැගීම</u>**

2014 වර්ෂයේ නොවෙම්බර් මස 05 වන දින, රජය විසින් 2015 වර්ෂයේ අයවැය සඳහා ගෙන එන ලද සංශෝධන මගින් ජාතික අයවැය දෙපාර්තමේන්තු ශීර්ෂය යටතේ 'සංවර්ධන ක්‍රියාකාරකම්' සඳහා වන ප්‍රතිපාදන රුපියල් බිලියන 446ක් දකවා හතර ගුණයක වැඩි කරන ලදී.

'ඔටුවාට කූඩාරමට නාසය දමා ගැනීමට දුනහොත් ඉතාම ඉක්මනින් ඌ මුළු ඇඟම ඇතුළට ගනු ඇත', යනුවෙන් පැරණි ආරාබි පිරුළක් ඇත. 'ජාතික අයවැය' යන ශීර්ෂය යටතේ 'සංවර්ධන ක්‍රියාකාරම්' ප්‍රතිපාදන සම්බන්ධ යතාර්ථය මෙයයි. 2014 වර්ෂයේදී, මෙම අභිමතානුසාරී අරමුදල සඳහා වෙන්කරනලද මුදල මුළු වියදම් වලින් 3%කි. එය ඔටුවාගේ නාසය නම්, ඉක්මනින්ම ඔටුවාගේ ඇඟම කූඩාරම ඇතුළට දමා ගනු ඇත. 2015 වර්ෂය සඳහා වර්තමාන ප්‍රතිපාදන වෙන්කිරීම, මුළු වියදම් වලින් 17% **ක් වන අතර** අවම වශයෙන් පස් ගුණයක වැඩි වීමකි**.**

2013 වර්ෂයේ අංක 36 දරන විසර්ජන පනතේ 6 (1) කොටස මගින් ගෙන එන ලද මෙම ප්‍රතිශෝධනය; අයවැය වාර්තාවේ සියලු ක්ෂේත්‍රවල ප්‍රතිපාදන ගැටලුකාරී තත්වයකට පත් කරනවා පමණක් නොව අයවැය කතාවේ මූල්‍යමය ඉලක්ක සහ වගකීම් සම්බන්ධ ප්‍රකාශනද නොසළකා හරිනු ලබයි. ජනාධිපතිවරයා විසින් කියවන ලද 2015 වර්ෂයේ අයවැය ලේඛනය 4.6% ක අයවැය හිගයක් පූර්වාපේක්ෂා

කරන ලදි. වර්ෂ 2006 **යේ** සිට සෑම අවස්ථාවකම සිදු වූවාක් මෙන් ආදායම පිළිබඳ ප්‍රක්ෂේපනය යතාර්ථවාදී නොවන නිසා 4.6%ක් වූ අයවැය හිගය **ධනාත්මක** එකකි (රූප සටහන බලන්න). අයවැයට සිදුකරනලද ප්‍රතිශෝධන මගින් හඟවනු ලබන්නේ, අයවැය පරතරය විශාල ලෙස වෙනස් විය හැකි බවයි. වඩා යහපත් ආදායම් නිරූපණ මගින් පවා අයවැය පරතරය 7.7] දක්වා වර්ධනය විය හැකිය යන තත්වය යටතේ, අයවැයට සිදු කරනලද ප්‍රතිශෝධන මගින් හඟවනු ලබන්නේ, එම ප්‍රතිශෝධනය යටතේ අයවැය පරතරය විශාල ලෙස වෙනස් විය හැකි බවයි.




<u>පාර්ලිමේන්තුවේ අවධානයට යටත් නොවීම බරපතල තත්ත්වයකි.</u>

දේශපාලකයින් සමඟ දූෂිත ලෙස සන්ධානගතවී සිටින **නිලධාරීවාද**යට, තම අභිමතය පරිදි මුදල් ප්‍රතිපාදන වෙන් කිරීමට ඉඩකඩ සලසන නීති, අයවැයෙහි විශ්වාසනීයත්වය පමණක් නොව රටේ මූල්‍ය කළමනාකරණයට සහ ආර්ථික සංවර්ධනයට තර්ජනයකි.

වගකීමක් සහිතව යොදා ගනු ලැබුවහොත් පිළිගත හැකි යයි කියන මෙම 'අභිමත අරමුදල' 17%කින් වර්ධනය වීම මගින් පෙන්වන්නේ, අයවැය ක්‍රියාවලිය පාර්ලිමේන්තුවේ **පාලනය සහ විචාරාත්මක මැදිහත්වීම** යටතේ සිදු නොවුනහොත්, ඉතා ඉක්මනින් පාලනයකින් තොර විය හැකි බවයි.

විධායක ජනාධිපති ක්‍රමය ප්‍රතිසංස්කරණය කරන්නේය යන පදනම මත විරුද්ධ පක්ෂය වත්මන් ජානධිපතිවරණයට මුහුණ දී ජයග්‍රහනය කර ඇත. නමුත් මෙම විශ්ලේෂණය මගින් පෙන්වා දෙනු ලබන්නේ, ශ්‍රී ලංකාවේ ප්‍රතිසංස්කරණ අවශ්‍ය වන්නේ විධායකය සඳහා පමණක් නොවන බවයි. ජනතාවට බලපාන තීරණ සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ මැදිහත්වීම සම්බන්ධ ප්‍රතිසංස්කරණද අවශ්‍ය වෙයි.